පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்

DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 12 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

# ඉන්දීය ඉතිහාසය I පත්‍රයේ පිළිතුරු

| | | | |
|---|---|---|---|
| (1) - 3 | (11) - 3 | (21) - 3 | (31) - 2 |
| (2) - 1 | (12) - 5 | (22) - 5 | (32) - 5 |
| (3) - 2 | (13) - 3 | (23) - 5 | (33) - 3 |
| (4) - 1 | (14) - 5 | (24) - 5 | (34) - 4 |
| (5) - 2 | (15) - 3 | (25) - 5 | (35) - 2 |
| (6) - 4 | (16) - 2 | (26) - 1 | (36) - 1 |
| (7) - 4 | (17) - 1 | (27) - 2 | (37) - 1 |
| (8) - 3 | (18) - 2 | (28) - 3 | (38) - 2 |
| (9) - 5 | (19) - 1 | (29) - 1 | (39) - 5 |
| (10) - 3 | (20) - 2 | (30) - 3 | (40) - 3 |

| ශ්‍රේණිය |
| --- |
| 12 |

## තෙවන වාර පරීක්ෂණය - 2023

## ඉන්දීය ඉතිහාසය II පත්‍රයේ පිළිතුරු

**02) ඉන්දියානු ඉතිහාසය කෙරෙහි වයඹදිග කපොලු බලපෑ ආකාරය පැහැදිලි කරන්න.**

- ඇෆ්ගන් කඳු, සුලෙයිමාන් කඳු, කිර්තාර් කඳු හා හින්දුකුෂ් කඳු ආශ්‍රිතව වයඹදිග කපොලු මාර්ග පිහිටා ඇත.

- වයඹදිග කපොලු,
  - කයිබර් දුර්ග මාර්ගය (කාබුල් නදී නිම්නයේ සිට පෙෂාවර් දක්වා).
  - බෝලාන් දුර්ග මාර්ගය (සුලෙයිමන් කඳුවලට බටහිරින් පිහිටා ඇත).
  - මක්රාන් දුර්ග මාර්ගය (කිර්තාර් කඳු හා අරාබි මුහුද අතර පිහිටා ඇත).
  - හේරාත් දුර්ග මාර්ගය (ඇෆ්ගන් කඳු ආශ්‍රිත ප්‍රදේශයේ සිට සිංදු ගංගා නිම්නය දක්වා).

- බටහිර ආසියාවත් ඉන්දියාවත් අතර සම්බන්ධතාව තහවුරු කරනු ලැබුවේත්, ඉන්දියාව බටහිර ලෝකය සමඟ සම්බන්ධතා පවත්වාගෙන යනු ලැබුවේත් මෙම දුර්ග මාර්ගය ඔස්සේය.

- කපොලු ඔස්සේ ඉන්දියාවට සංක්‍රමණය වූ මුල් ජනපදිකයන් ඉන්දියාවේ දේශපාලන, සමාජ හා ආර්ථික පරිවර්තනයක් ඇති කිරීම.

- කපොලු මාර්ග ඔස්සේ ග්‍රීක, ශක, පාර්තියන්, කුෂාණ, හූණ, අරාබි, තුර්කි හා මෝගල් වැනි විජාතික ජන කණ්ඩායම් ඉන්දියාවට පිවිසීම.

- ඉන්දියානු දේශපාලන ආධිපත්‍යය මෙන්ම ආගම්, සංස්කෘතිය හා දර්ශනය ඉන්දියාවෙන් බැහැරට ව්‍යාප්ත කිරීම සිදු වූයේ වයඹදිග කපොලු ඔස්සේය.

- ග්‍රීක, ඉස්ලාම් හා මෝගල් ගෘහ නිර්මාණ ශිල්ප ක්‍රම, මූර්ති කලාව හා චිත්‍ර කලාව වැනි සංස්කෘතිකාංගවලින් ඉන්දියානු ඉතිහාසය පෝෂණය වීම.

- ඉන්දියාවෙන් පිටත මධ්‍ය ආසියාව, චීනය දක්වා බුදු දහම ව්‍යාප්ත වීම සහ මධ්‍ය ආසියාවේ බෞද්ධ මධ්‍යස්ථාන ආරම්භ වීම.

- චීනය, මධ්‍ය ආසියාව, පර්සියාව, ග්‍රීසිය, අරාබිය වැනි පෙර අපර දෙදිග අටවල් සමඟ වෙළඳ සබඳතා පවත්වා ගෙන යෑම මගින් වාණිජ රටාවේ ප්‍රබල වර්ධනයක් සිදුවීම.

- දුර්ග මාර්ග ඔස්සේ ඉන්දියාවට පැමිණි දේශගවේශකයන් සමකාලීන ඉන්දියානු ඉතිහාසය පිළිබඳව තොරතුරු අනාවරණය කර තිබීම - මෙගස්තිනිස්, පාහියන්, හියුංත්සාං.

- වයඹදිග ඉන්දියානු කපොලු ආරක්ෂා කර ගැනීමට ඉන්දියානු පාලකයන් කොතෙක් උත්සාහ දරනු ලැබුවද ඉතිහාසය පුරාම වයඹදිග දුර්ගමාර්ග අනාරක්ෂිතව පැවැතීම ඉන්දියානු ඉතිහාසය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කිරීම.

03) **(I)** හරප්පා

*(ලකුණු 01 යි)*

**(II) මෝටිමර් විලර්, ජෝන් මාෂල්, කනිං හැම්, ස්ටුවට් පිගොට්**

*(ලකුණු 02 යි)*

**(III) මෙම ශිෂ්ටාචාරයෙහි නගර සැලසුම් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.**

- පූර්ව සැලැස්මකට අනුව නගර සකස් කිරීම.
  නගර සැලසුමේ දී, සෑම නගරයකයම පොදු සමානාත්මතාවයකින් යුතුව සකස් කිරීම.
- ප්‍රාදේශීය නගරද සැලසුම් සහගතව ඉදි කිරීම (කලිබන්ගන්, චන්හුදාරෝ, රූපාර්).
  නගර සැලසුමේ දී ඇතුගල්නුවර හා පිටිනුවර ලෙස කොටස් දෙකකින් සමන්විත වීම.
- ඇතුගල්නුවර ගොඩනැගිලි උස් වේදිකාවක් මත ඉදිකර තිබීම. එම නුවර පරිපාලන මධ්‍යස්ථානය ලෙස භාවිතා කිරීම.
- නගරය වටා මුර අට්ටාල සහිත ප්‍රාකාරයක් ඉදිකර තිබීම. බලකොටු ස්වරූපයක් දැකිය හැකිය.
- මහල් සහිත ගොඩනැගිලි නිර්මාණය කිරීම.
- සෑම නිවසක්ම ළිඳකින් හා නාන කාමර ඇතුළුව වෙනත් සෞඛ්‍ය පහසුකම්වලින් යුක්ත වීම.
- ඇතැම් නිවාසවල විවෘත මැද මිදුලක් දක්නට ලැබීම.
- නිවාසවලට පිවසෙන දොරටු ප්‍රධාන මාර්ගයට මුහුණලා ඉදිකොට නොතිබීම.
- ආයත චතුරශ්‍රාකාර සැලැස්මකට අනුව නගර ඉදි කිරීම.
- විශාල නගර ඇතුළත පුළුල් මංමාවත් නිර්මාණය කිරීම හා එම මාර්ග සැලසුමකට අනුව රේඛානුකූලව විහිදුණු මාර්ග පද්ධතියක් වශයෙන් සකස් කොට තිබීම.
- වීථි නිර්මාණය සෘජුකෝණාශ්‍රාකාර අයුරින් සිදු කිර තිබීම.
- දියුණු සෞඛ්‍ය හා සනීපාරක්ෂක ක්‍රම භාවිතා කරමින් මනා ජලාපවාහන හා මළ ප්‍රවාහන පද්ධතියක් සකස් කර තිබීම.
- ප්‍රධාන මාවත්වලට දෙපසින් කාණු පද්ධතියක් ඉදිකර තිබීම.
- සෞඛ්‍ය සම්පන්න බවට මුල් තැන දෙමින් නගරය සැලසුම් කිරීම.

➢ කම්කරු නිවාස වෙනම ඉදිකොට තිබීම හා ඒවා ධාන්‍යාගාරයට ආසන්නව පිහිටා තිබීම.

*(ලකුණු 04 යි)*

**(IV) 'ඉන්දුනිම්න ශිෂ්ටාචාරය නාගරික ශිෂ්ටාචාරයකැ'යි යන ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද හේතු දක්වන්න.**

නාගරික ශිෂ්ටාචාරයක දක්නට ලැබෙන ලක්ෂණ ඉන්දුනිම්න ශිෂ්ටාචාරයෙන් හඳුනා ගෙන ඇති බැවින්, එම ශිෂ්ටාචාරය නාගරික ශිෂ්ටාචාරයක් ලෙස සැලකේ. එම ලක්ෂණ මෙසේය :

- මනා සැලසුමකින් යුතු මහා පරිමාණයේ නගර බිහිවීම (මොහෙන්ජොදාරෝ, හරප්පා, ධොලවීර).
- සියලු නගරවල නිර්මාණ සැලසුම එක හා සමාන වීම (පවුර, බලකොටු සහිත ප්‍රදේශය, වාසස්ථාන පැවති ප්‍රදේශය, මාර්ග පද්ධතිය, ජල ප්‍රවාහන ක්‍රම).
- විශාල ගොඩනැගිලි දක්නට ලැබීම. (මොහෙන්ජොදාරෝවේ ස්නානාගාරය, හරප්පාවේ ධාන්‍යාගාරය, වීථි ආලෝක කුලුණු, රබිගාර්හි විශාල ස්නානාගාරය).
- ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ප්‍රධාන වශයෙන් ගඩොල් භාවිතා කිරීම. (පිළිස්සූ හා හිරු එළියෙන් වේලාගත්)
- කෘෂිකර්මයේ අතිරික්තය භුක්තිවිඳින පාලක හා පූජක පන්තියක් සිටීම.
- මනා පාලන සංවිධානයකින් යුක්ත වීම.
- සංකීර්ණ සමාජයක් පැවතීම. (ස්ථර වශයෙන් විවිධ ජන කොටසක් - පාලක, පූජක, ප්‍රභූ පන්තිය, නාගරික ජනතාව, වෙළෙන්දන් කම්කරුවන්, විවිධ වෘත්තිකයන්).
  ප්‍රභූ පන්තිය සහ කම්කරුවන් සඳහා නිවාස වෙන් කොට තිබීම.
- ආර්ථිකයේ ප්‍රධාන අංශය කෘෂිකර්මාන්තය වීම.
- අභ්‍යන්තර හා බාහිර වෙළඳාම (සුමේරියාව දක්වා) - වාරායන්, කිරුම් මිනුම් ක්‍රම.
- ලෝහ භාවිතය (රන්, රිදී, තඹ, ලෝකඩ, යකඩ භාවිතයෙන් ආභරණ හා මූර්ති නිපැයුම)
- රූපාක්ෂර සහිත ලේඛන ක්‍රමයක් තිබීම.
- කලාව (චිත්‍ර, මූර්ති, මුද්‍රා).
- ගමනාගමනය
- විනෝදාංශ (රිය ධාවනය, දාදු ක්‍රීඩාව, දඩයම).

***(ලකුණු 08 යි)***

04 ) **වෛදික යුගයේ පැවති සමාජ හා ආගමික තත්ත්වය පශ්චාත් වෛදික යුගයේ දී වෙනස් වී ගිය ආකාරය පැහැදිලි කරන්න.**

- ❖ ඍග් වේදයෙන් අනාවරණය වන කාලය වෛදික යුගය ලෙසත් යජුර්, සාම, අථර්වන්, බ්‍රාහ්මණ, ආරණ්‍යක හා උපනිෂද් වලින් හෙළිවනු ලබන කාලය පශ්චාත් වෛදික සමය ලෙසත් හැඳින්වේ.

- ❖ ඍග් වෛදික යුගය ගෝත්‍රික හා ග්‍රාමීය ලක්ෂණ වලින් යුක්ත වූ අතර භරත, යදු, කුරු ආදී ගෝත්‍ර ගණනාවක් මේ අවධිය තුළ දැක ගත හැකි විය. පවුල් ගණනාවක් පදිංචි වූ ඒකකය ගම වූ අතර පවුලේ ප්‍රධානියා පියා වූ බැවින් වෛදික සමාජය පීතෘ මූලික සමාජයක් ලෙසින් සැලකේ. එබැවින් ගෝත්‍රික සමාජයේ සිට තරමක් ස්ථාවර සමාජයක් කරා ගමන් කිරීමක් පශ්චාත් වෛදික යුගයේ දී දැකගත හැකිය.

- ❖ වෛදික සමය පැහැදිලි කුල භේදයක් දක්නට නොමැති වුවද ආර්ය අනාර්ය භේදය පැවැතිනි. පශ්චාත් වෛදික සමය වන විට ප්‍රධාන වර්ණ (කුල) හතරකට සමාජය බෙදුනු අතරම සංකීර්ණ කුල සමාජයක් දක්වා වර්ධනය විය. බ්‍රාහ්මණ, ක්ෂත්‍රීය, වෛශ්‍ය හා ශුද්‍ර යනුවෙන් හැඳින්වෙන එම කුලයන් සතු නිශ්චිත කාර්ය කොටසක් ද පැවැතිනි. බ්‍රාහ්මණයන් ඉහළ කුලය නියෝජනය කළ අතර ක්ෂත්‍රියයන් රට පාලනය කළහ. වෛශ්‍යන් ගොවිතැන හා වෙළඳ කටයුතුවල නිරත වූ අතර ශුද්‍රයෝ ඉහළ කුලවලට වහල් සේවකයෝ වූහ. මීට අමතරව නිෂාද වැනි කුලයන් පැවැතිනි. නිෂාද කුලය තවත් කොට්ඨාශ අටකට බෙදී තිබුණි. එනම් ව්‍රත, පංජිෂ්ඨ, ගවානිස්, මෘගායු, තක්ෂාන් (වඩු), රථකාර, කුළාල (කුඹල්), කර්මාර (යකඩ කාර්මික) වශයෙනි. බ්‍රහ්මචාරී, ගෘහස්ථ, වානප්‍රස්ථ හා සන්‍යාසී යන වර්ණාශ්‍රම ධර්මවලට අනුව මෙකල සමාජය හැඩගැසී තිබුණි.

- ❖ ඍග් වෛදික යුගයේ කාන්තාවගේ සමාජ තත්ත්වය පශ්චාත් වෛදික යුගයේ මෙන් නොපිරිහුණු අතර දුවකගේ උපත පහත් කොට නොසැලකිනි. පවුලේ ප්‍රධානියා භර්යාව සමඟ පූජාවන්ට සම්බන්ධ වූ අතර සමහර කාන්තාවෝ ඉහළ මට්ටමින් අධ්‍යාපනය ලැබූහ.
  විශ්වචාරා, අපාලා හා ඝෝෂා වැනි කාන්තාවන් ස්තෝත්‍ර ප්‍රබන්ධයනට විශේෂ දක්ෂතා ඇති උගත් කාන්තාවන් ලෙසින් සැලකිනි. පශ්චාත් වෛදික සමය වන විට කාන්තාවගේ සමාජ තත්ත්වය පිරිහීම හා අධ්‍යාපනය ලබා ගැනීමට තිබූ අවකාශය අහිමිවීම සිදුවිය.

- ❖ ඍග් වෛදික යුගයේ විවාහ චාරිත්‍ර පැවැති අතර එහි පරමාර්ථය වූයේ පරපුර පවත්වාගෙන යාමට මෙන්ම මවගේ හා පියාගේ අවමංගල්‍ය කටයුතු සිදු කිරීම පිණිස පුතෙකු ලබා ගැනීමය. දායාද දීම ප්‍රධාන කොට ගත් විවහාය ඉතා ඉහළ මට්ටමකින් පවත්වනු ලැබූ අතර ධන ධාන්‍ය හෝ ගව සම්පතින් දායාද සිරිනැමිනි. පශ්චාත් වෛදික සමය වන විට විවාහයද වර්ණ (කුල) ප්‍රමයට අනුගත වූ අතරම කාන්තාවට තිබූ නිදහස ක්‍රමයෙන් අඩු විය.

- ❖ සාමාන්‍යයෙන් ඒකභාර්යා සේවනය ඍග් වෛදික සමාජය තුළ පැවැති අතර බහුභාර්යා සේවනය තිබූ බවට ද තොරතුරු ඍග් වේදයෙන් ලැබේ. වැන්දඹු ස්ත්‍රියට නැවත විවාහ වීමට අවකාශය ලැබිනි. පශ්චාත් වෛදික යුගයේ දී ඒකභාර්යා හා බහු භාර්යා සේවනය තිබුණ අතර වැන්දඹු කාන්තාව සමාජයේ පහත් තත්ත්වයට වැටිනි. නැවත විවායට තිබූ අවකාශයද ක්‍රමයෙන් නැතිවිය.

- කිරි, ගිතෙල්, පළතුරු, තිරිඟු හා බාර්ලි වැනි ධාන්‍ය වර්ග ඍග් වෛදික යුගයේ ප්‍රධාන ආහාරය වූ අතර විශේෂ උත්සව අවස්ථාවන්හි මස් මාංශ අනුභවයට ගෙන ඇත. සුරාව පැවැති අතර උත්සව අවස්ථාවන්හි සෝම යුෂ පානය කොට ඇත. ඇඳුම් පැළඳුම් චාම් වූ අතර එය කොටස් හතරකින් සමන්විත විය. එනම් 'නිවි' හෙවත් යටිකය ඇඳුම, 'පරිධෝන' හෙවත් උඩු ඇඳුම, 'අධිවාස' හෙවත් උතුරු සළුව හා හිස්වැස්ම ද වේ. ලෝම, කපු, මුවහම් ආදියෙන් මෙම වස්ත්‍ර සකසා ඇත.  පිරිමින් හිස් ආවරණය කළ අතර ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයම ආභරණ පැළැන්දාහුය. කර්ණ සොභණ, හිරණ්‍ය හා කුරීන වැනි ආභරණ වර්ග පැළැන්දෝය. විනෝදාංශ අතර සංගීතය, ගායනය, නැටීම හා දූකෙළිය මෙන් රිය ධාවනය ද පැවති බවට සාක්ෂි තිබේ. නිවාස දැව උණ ලී ආදියෙන් තනා පිදුරු සෙවිලි කොට ඇත. පශ්චාත් වෛදික සමය තුළ ඉහත ආහාර පානවලට මුල් තැනක් හිමි විය. ආභරණ හා ඇඳුම් පැළඳුම්වල වෙනසක් සිදු විය.

- මුල් වෛදික ජනතාව ස්වාභාවික වස්තූන්ට වන්දනාමාන කළ අතර දිව්‍ය ලෝකය, අන්තරික්ෂය හා පෘතුවාය යන ස්ථානවල සංඛ්‍යාවෙන් විශාල ප්‍රමාණයක් දෙවියන් සිටින බවත් විශ්වාස කළහ. ස්වාභාවධර්මයේ විවිධ බලවේගයනට දේවත්වය ආරෝපණය කොට ස්තෝත්‍ර ගායනය කළහ. දෙවියන් සතුටු කිරීමට ඔවුහු යාඥා කළහ. අග්නි හෙවත් ගින්න දෙවියන් හා යාගය පවත්වන්නා අතර සම්බන්ධීතාරක වූ අතර විවිධ අරමුණු ඔස්සේ යාග පවත්වා ඇත. පිරිමි දෙවියනට මුල් තැනක් ලැබුණි. වරුණ, ඉන්ද්‍ර, මිත්‍ර, සාවිත්‍රි, උෂස්, මාරුත් හා වායු වැනි දෙවිවරුනට වන්දනා මාන පැවැත්වූය. කිරි, ගිතෙල්, සුවඳ වර්ග ගින්නට දමා දෙවියන් සතුටු කිරීමට සරල යාගයන් පැවැත් වූ අතර සතුන් බිළිදීම වැනි යාග ක්‍රමයන් මෙතල නොපැවතිනි. බහුදේවවාදී සංකල්පයට මෙකල ඉඩක් ලැබ තිබිණි.

- ඍක් වෛදික යුගයේ වැදගත් වූ ඉන්ද්‍ර, වරුණ මෙන්ම මාරුත්, අග්නි, සෝම වැනි දෙවිවරුන් කෙරෙහි දැක්වූ සැලකිල්ල ක්‍රමයෙන් අඩු වී ගිය අතර යන්ත්‍ර මන්ත්‍ර තන්ත්‍ර ආදිය කෙරෙහි මෙන්ම භූත, ප්‍රේත වැනි බලවේග කෙරෙහි ජනයාගේ වැඩි අවධානයක් යොමු වූ බව අථර්වන් වේදයෙන් පැහැදිලි වේ. ඍග් වෛදික යුගයේ පැවැති බහු දේවවාදී ආගමික සංකල්පය

*(ලකුණු 16 යි)*

**05) (I)** මේ පිළිබඳව අදහස් නිහිපයක් ඉදිරිපත්ව ඇත.

- ජල ගැලීම නිසා පරිහානියට පත් වීම.
  මෝටිමර් විලර්, A.V. ෂර්මා, ජෝන්මාෂල් යන අය මේ මතය තහවුරු කරයි.
- රාවී ගඟේ ගමන් මාර්ගය වෙනස් වීම, ස්තර අතර රොන් මඩ තැම්පත් වීම, පාදම වරින් වර උස් කොට තැනීම, දොර ජනෙල් තාවකාලිකව වසා දැමීම.
- ක්‍රමික පරිහානිය පිළිබඳ අදහස්
  - ආර්ථික පරිහානිය (ලෝතාල් ග්‍රාමීය සභ්‍යත්වය)
  - පාලනය දුර්වල වීම.
  - ජනගහනය අධික වීම.
  - කාල ගුණික වෙනස් වීම් හා වසංගත රෝග.
- සතුරු ආක්‍රමණ මඟින් විනාශ වීම.
  - හදිසි සතුරු ආක්‍රමණයකට මුහුණ දීම නිසා මෙම ශිෂ්ඨාචාරය තුළ වෙනස්කම් රැසක් දක්නට ලැබීම.
  - මළවුන් මිහිදන් කිරීමේ ක්‍රමයට පටහැනි මළසිරුරු ඇටසැකිලි හමු වීම.
  - ඒවායේ පොරෝ පහරක් වැනි පැලුම් තුවාල තිබීම.
  - ඉන්දු නිම්නයට වඩා වෙනස් වැයක් වැනි ආයුධ හා සංග්‍රාමීය කටයුතුවලට යොදා ගන්නා මැද නාරටිය ශක්තිමත් කඩු හමු වීම.
  - ඍග් වේදයේ සඳහන් කරන පරිදි ආර්යන්ගේ ඉන්දු දෙවියා විසින් පුර විනාශ කළ බව සඳහන් වැකි තිබීම.

**(II)** ඍග් වෛදික යුගයේ පැවති සරල පාලන

- රටාව සංකීර්ණ තත්ත්වයට පත්වීම.
- රජවරුන්ගේ බල පරාක්‍රමය වැඩි වී ඔවුන් වර්ග කිරීම. ඓතරීය බ්‍රාහ්මණයේ,

1. සාම්රාට් (අධිරාජ) - පෙරදිග රජවරු
2. භෝජ - දකුණේ රජවරු
3. විරාට් - උතුරේ රජවරු
4. රාජන් - මධ්‍යම ප්‍රදේශයේ රජවරු

- පාලකයන්ට දේවත්වය ආරෝපණය කිරීම.
  උදා - මනුස්මෘතියේ රජු පෘතුවියේ දෙවියා
- අශ්වමේධ, පුරුෂමේධ, රාජශුය වැනි මහා පරිමාණ යාග තිබීම.
- සමිති සභා යන පාලන ආයතන පැවතීම.
- රජුගේ පාලනයට සහය දැක් වූරක්තීන් හෙවත් රාජකාත්වරු සිටීම. එවැනි නිලධාරීන් රැසක් ගැන ශතපථ බ්‍රාහ්මණයේ සඳහන් වීම.
  උදා - පොරෝහිත - රජුගේ උපදේශක
  සේනානි - සෙම්පතිවරයා
  සංගෘහිත්‍රි - භාණ්ඩාගාරික
  භාගදුග - ආදායම් නිලධාරී

## (III) ක්‍රි.පූ.හයවන සියවසෙහි ගණ රාජ්‍යය

- ක්‍රි.පූ.හයවන සියවසෙහි ඉන්දියාවේ සොළොස් මහා ජනපද තුළ ක්‍රියාත්මක වූ පාලන ක්‍රම දෙක වූයේ රාජාණ්ඩු පාලන ක්‍රමය හා ලණ රාජ්‍යය (සමූහාණ්ඩු) පාලන ක්‍රමයයි.
- වජ්ජී හා සල්ල කැපී පෙනෙන සමූහාණ්ඩු වේ.
- බෞද්ධ සාහිත්‍යයේ සණ රාජ්‍ය 09ක් පිළිබඳව සඳහන් වේ. (කපිලවස්තුවේ ශාක්‍යන්, වෛශාලියේ ලිච්ඡවීන්, මිථිලාවේ වේදේහයන්, රාම ග්‍රාමයේ කෝලියවරුන්, කුසිනාරාවෙහි පාවාහි මල්ලයන්, අල්ලකප්පයේ බුලිවරු, කේසපුත්තයේ මෝරියවරුන්, සුංසුමාරගිරියේ භග්ගයන්).
- මේවායේ රාජ්‍ය ප්‍රධානීන් සණපත්, සණ ජ්‍යෙෂ්ඨ හා සණ රාජන් යන කම්වලින් හැඳින්වේ.
- මෙහි පාලනය නියෝජිතයන් රැසකගෙන් සැදුම්ලත් සභාවක් මගින් සිදුවීය.
  ලිච්ඡවී සමූහාණ්ඩුවේ රජවරු 7707 ක් සිටි බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ.
- පාලක මණ්ඩලය රැස් වූ ශාලාව 'සන්ථාගාර' (කූඨාගාර ශාලා) නම් විය.
- පාලන ප්‍රතිපත්ති සල්ත - අපරියාණි ධර්ම අගය කළහ.
- 'ප්‍රවේණි පුස්තක' අනුව රාජ්‍යයේ අධිකරණ කටයුතු සිදුකරනු ලැබීය.
- චන්ද්‍රගුප්ත මෞර්ය රාජ සමයේ දී සණ රාජ්‍ය මුලිනුපුටා දැමීම සිදු විය.

*(ලකුණු 08 යි)*

## (IV) ෂඩ් ශාස්තෘවරු

**ප්‍රාය්මණ ආගමික සම්ප්‍රදායන් බැහැරට නැඟී ආ උපනිෂද් දර්ශනය ක්‍රි.ව. 06 වන සියවසේ දී එහි උච්චතම අවධියට ලඟා විය. මෙහි දී නැගී ආ ශ්‍රමණ කණ්ඩායම්හි දෘෂ්ටිවාද හැට දෙකක් බිහි වූ අතර එහි හයක් ප්‍රධාන විය. මේවා ෂඩ් ශාෂ්තෘවරු ලෙස දැක්වේ.**

- නිගණ්ටනාථපුත්ත (වර්ධමාන මහාවීර) ජෛන ධර්මය.
  ලෝක විග්‍රහය/පංච විරමණය.
- පූර්ණ කස්සප - අකිරියවාදය
- මක්ඛලිගෝසාල - නියතිවාදය
- අජිතකේශකම්බල - භෞතිකවාදය
- පකුධකච්චායන - භාස්වතවාදය
- සංජය බෙල්ලට්ටපුත්ත - අමරාවික්කේෂවාදය

06)

- නන්දන පාලකයෙකුට දාව මූරා නම් තැනැත්තියකගේ කුසින් මොහු උපත ලද බව පුරාණ ග්‍රන්ථවල සඳහන් වන අතර ප්ප්එලි වනයේ මෝරිය ගෝත්‍රිකයෙකු බවට මතයක් පැවතීම.
- ග්‍රීක මූලාශ්‍ර මොහු 'සන්ද්‍රකොට්ටාස්' නමින් හඳුන්වා තිබීම.
- චානක්‍යගේ (විශ්ණුගුප්ත, කෞටිල්‍ය) උපදෙස් මත නන්ද පාලනය අවසන් කොට මගධයේ බලය ලබා ගැනීම
- වයඹදිග ඉන්දියාව ග්‍රීක බලයෙන් මුදා ගැනීම. සෙලියුකස් නිකේටර් සමඟ සටන් කිරීම හා චන්ද්‍රගුප්ත මෞර්ය හා ඔහු අතර ගිවිසුමක් ඇති වීම.
  එමගින් ඒරියා (හේරාට්), ඇරකෝෂියා (කන්දහාර්), පරෝපනිෂදායි (බලුකිස්තාන්), ගෙඩ්රෝෂියා (කාබුල්) යන ප්‍රදේශ චන්ද්‍රගුප්තට හිමිවීම හා එබැවින් පර්ෂියානු මායිම දක්වා ඔහුගේ අධිරාජ්‍ය ව්‍යාප්ත වීම.
- චන්ද්‍රගුප්ත රජු ඇතුන් 500ක් සෙලියුකස් නිකේටර්ට ලබා දීම හා සෙලියුකස් නිකේටර් තම දියණිය චන්ද්‍රගුප්තට විවාහ කර දීම.
- මෙගස්තිනීස් තානාපතියෙකු ලෙස මෞර්ය අධිරාජ්‍යය වෙතට එවීම.
- අධිරාජ්‍යයේ බලය ඩෙකෑන් හා දකුණ දක්වා ව්‍යාප්ත වීම.
  ඔහුගේ අධිරාජ්‍යයට බටහිරින් පිහිටි කතියවාර් අර්ධද්වීපයේ සුරාෂ්ට්‍ර දේශය පවා අයිති වූ බව රුද්‍රදාමන්ගේ ජුනාගාද් ගිපියෙන් සනාත වීම. ඔහු එහි පාලකයා බවට පත්වීම හා සුදර්ශන විල ප්‍රතිසංස්කරණය කරවීම.
- විදේශ සම්බන්ධතා පැවැත්වීම. (සිරියාව, ඊජිප්තුව සමඟ).
- ගොඩබිම් හා මුහුදු මාර්ග ඔස්සේ වෙළඳාම පවත්වාගෙන යාම.
- මනා පරිපාලන සංවිධානයක් ඇති කිරීම.
  මධ්‍යපාලනය (මන්ත්‍රී පර්ෂද්. අමාත්‍ය, මයාමාත්‍ය, අධක්ෂ, පුරෝහිත, හුවරාජ, සේනාපති)
  ප්‍රාන්ත පාලනය (තක්ෂිලා, කෝසලී, ස්වර්ණගිරි, උප්ජේනි, ප්‍රාච්‍ය)
  නාගරික පාලනය (පාඨලීපුත්‍ර ෘ සාමාජිකයන් 05 දෙනෙකුගෙන් සමන්විත කමිටු 06ක් පැවති බව)
  ග්‍රාම පාලනය (ග්‍රාමික, ගෝප)
- කෘෂිකර්මාන්තය දියුණු කිරීම (වාරි මාර්ග)

***(ලකුණු 16 යි)***

07) **'ධර්මාශෝක අධිරාජ්‍යයා මෞර්යයේ බිහි වූ ශ්‍රේෂ්ඨතම පාලකයෙකි.'**

**(I)** බින්දුසාර.

**(II)** සාංචි, ගිර්නාර්, රුම්න්දෙයි, ධෞලි 13 වන ගිරි ලිපිය.

**(III)** උදේනි ජයග්‍රාහනය කිරීම.
කාලිංගය ජයග්‍රාහනය කිරීම.
කාලිංගය යුද්ධය රජ්ගේ පෞද්ගලික ඩීවිතයද පාලන ප්‍රතිපත්තිද වෙනස් කිරීමට සමත් වීම. ඒ බව 13 වන ගිරි ලපියේ සඳහන් කිරීම.

- ඒ අනුව අශෝක අධිරාජ්‍යය බටහරින් සුනාපරන්‍ය, සෞරාෂ්ටය, බටහිර අවන්තිය යන ප්‍රදේශ ඇතුළුව අරාබි මුහුදේ බටහිර වෙරළ දක්වාද
- ගිණිකොණින් කාලිංගය හා බෙංගාලයේ බටහිර වෙරළ දක්වාද
- දකුණින් ස්වර්ණගිරයේ ක්‍රිෂ්ණ කුංගභාද්‍රා දක්වාද
- වයඹින් උත්තරාපථය හෙවත ගන්ධාරයද
- උතුරින් හිමාලය තෙක්ද පැතර පැවති බව පෙනේ.
- මේ අනුව අශෝක අධිරාජ්‍යාගේ දික්විජය ප්‍රතිපත්තිය අනුව මුල් භාරත දේහයම පාලනය කළ බව කිව හැකිය.

**(IV)**

- අශෝක ධර්මය සියළුම ආගම්වල සාරය එක්තැන් කළ ධර්මයක් ලෙස හැඳින්වීම.
- අශෝක ධර්මය සදාචාර සංවර්ධන හා සාමකාමී සහජීවනය මුල් කොටගෙන පැවතීම.

උදා : 1. සුස්රූස - කීකරුභාවය
දෙමව්පියන්ට - වැඩිහිටියන්ට, ගුරුවරුන්ට හා උසස් කුලීනයන්ට කීකරු වීම.
2. ආචිති (ගරුත්වය)
සිසුන්, ගුරුවරුන් කෙරෙහිත් ගුරුවරුන්, සිය ශාස්තෘවරුන් කෙරෙහිත් ගෞරවය දැක්වීම.
3. සම්පතිපත්පි (නිරවද්‍ය සංග්‍රහාය)
බ්‍රාහ්මණයන්ට , ශ්‍රමණයන්ට, ඥාතීන්ට. සේවකයන්ට හා යැපෙන්නන්ට, දිළින්දන්ට, අසරණහින්ට, මිතුරන් හා සගයන්ට සංග්‍රහා කිරීම.
4.දන (නිදහස)
බ්‍රාහ්මණ, ශ්‍රමණ වැඩිහිටියන්ට දන් දීම.
5. ප්‍රණානාම් අතාරම්භ (සතුන් ඝාතනයෙන් වැළතීම)
සියලුම පණ ඇති සතුන් ඝාතනයෙන් හා වධහිංසාවලින් වැළකීම.

- සාමාන්‍ය දෛනික ජීවිතයේ ද පුද්ගල සම්බන්ධතාවල සාර්තකත්වයට හේතුවන පරිදි අශොක ධර්ම ප්‍රතිපත්තියේ කරුණු අඩංගු වේ.
උදා : සත්‍යගරුක වීම, කෘතවේදීක්වය, දැඩි කැපවීම, ත්‍යාගශීලීක්වය, ආදායම් හා වියදම් සමබරව පවත්වා ගැනීම.
අල්ප පිරිකර ඇති බව.
- සමාජයේ කුඩාම එකකය වූ පවුලේ සුභ සාධනය තුළින් සමස්ත සමාජයේම යහා පැවැත්ම අපේක්ෂා කිරීම.
- මෙම ප්‍රතිපත්තිය සෙල්ලිපිවල අන්තර්ගත කොට තිබීම. ගිරි ලිපි/පුවරු ලිපිවල හා ඒවා විවිධ භාෂාවලින් ලියා තිබීම.
- මෙම රජුගේ සමාජ සුභ සාධක සේවාවන් රැසකි.
  - කුකුළන් කෙටවීම. ගොං පොර වැනි සත්ව හිංසන ක්‍රීඩා තහනම් කිරීම.
  - මාංශ භක්ෂණය බොබෝ දුරට තහනම් කරන ලදී.
  - යාග හෝම සඳහා බිලි පූජා තහනම් කිරීම.
  - නිකරුණේ හෝ දඩයම පිණිස කැලෑ ගිණි තැබීම තහනම් කිරීම.
  - මඟීන්ට හා සතුන්ට ගිමන්හල් කරවීය.
  - ළිං පොකුණු, මංමාවත්, පැන්කාලී තැබීම. සෙවණ සඳහා ගස් සිටු වීම, ඔසු උයන්, රෝහල් ඉදි කිරීම. අම්බලන් තැනීම සිදු කරන ලදී.

**08) මෞර්ය පාලන ක්‍රමයේ ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ සාකච්ඡා කරන්න.**

මෞර්ය අධිරාජ්‍යය ඉන්දියාවේ ප්‍රථම අධිරාජ්‍යය ලෙස සැලකේ. පාටලීපුත්‍ර නගරය කේන්ද්‍ර කරගත් මෞර්ය අධධිරාජ්‍යය චන්ද්‍රගුප්ත, බින්දුසාර සහ අශෝක යන පාලකයන් යටතේ වර්ධනය විය.

මෞර්ය පාලන ක්‍රමය පිළිබඳව තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍ර කිහිපයකි. කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රය, විශාකදත්තගේ මුද්‍රා රාක්ෂය, පාතාංජලීගේ මහාභාෂ්‍යය, හද්‍රබාහුගේ කල්ප සූත්‍රය, දිව්‍යවදානය, මෙගස්තීනිස්ගේ ඉන්ඩිකා ග්‍රන්ථය, අශෝක සෙල්ලිපි.

මූලාශ්‍රගත තොරතුළුරවලට උනුව මෞර්ය පාලන ක්‍රමය කොටස් දෙකකට වෙන් කළ හැකිය.

1. මධ්‍යම පාලනය. 2. ප්‍රාදේශීය පාලනය.

**මධ්‍යම පාලනය.**

මධ්‍යම පාලනයේ ඉහළ නිලධාරියා රජුය. රාජ්‍යත්වය පාරම්පරිකව පියාගෙන් පුතාට හිමි විය. රජුට ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන සියලු බලතල හිමි විය. ඉන්දියාවේ ප්‍රථමවරට මහා අධිරාජ්‍යයක් හමුවන්නේ මේ කාලය තුළය.

රජුට අසීමිත බලයක් පැවතීම. නීති පැනවීම, නීති ක්‍රියාත්මක කිරීම, ප්‍රචාරය කිරීම, කඩ කරන අයට අඩුවම් දීම, රාජ්‍ය අදුශාසනා පැවැත්වීම, අයවැය පිළිබඳ සොයා බැලීම, විදේශ සමඟ සබඳතා පැවැත්වීම, උසස් නිලධාරීන් පත් කිරීම යන ලක්ෂණ දැකිය හැකි වීම.

<u>රජුට සහාය වූ නිලධාරීන්</u>

- රජු ළඟට සිටි ප්‍රධානතම නිලධාරියා උපරාජ විය. රජුගේ පුතා බොහෝ විට මේ තනතුර දැරීය.
- උපරාජයාට පහළ නිලධාරීන් රැසක් සිටීම. අභිලේඛනවල පුරුෂ යන නමින් ඔවුන් හඳුන්වා දීම. නිලධාරීන් කොටස් 03 කි.

  1. ඉහළ ගණයේ නිලධාරීන්
  2. මධ්‍යම ගණයේ නිලධාරීන්
  3. පහළ ගණයේ නිලධාරීන්

- මෞර්ය පාලනයට උපදේශක සභාවක් ද සහාය වී ඇත. අභිලේකනවල පරිෂා යන වචනය නමින් ද, අර්ථ ශාස්ත්‍රයේ පරිෂාද් යන වචනය ද ඊට භාවිතා වීම.
- මේ සභාව සාමාජිකයන් 12 ට නොවඩු හා 20 ට නොවැඩි වීම හා රජුගේ කැමැත්ත මත සාමාජික සංඛ්‍යාව තීරණය වීම.
- ඉහළ ගණයේ නිලධාරීන් තිදෙනෙකි : පුරෝහිත, අග්‍රාමාත්‍ය, සේනාපති, මෞර්ය පාලනය තුළ කෞටිල්‍ය, පුරෝහිත. හා අග්‍රාමාත්‍ය යන තනතුරු දෙකම ඉසිලීම.
- සේනාපති : අභ්‍යන්තර හා බාහිර තර්ජනවලින් රට ආරක්ෂා කිරීම, චතුරාංගනී සේනාව පවත්වා ගැනීම, සේනාවට නායකත්වය දීම, සාහය පවත්වාගෙන යාම සිදු කිරීම.
- මධ්‍යම ගණයේ නිලධාරීන් 06 දෙනකි : අන්තඃපුර පාලක, භාණ්ඩාගාරික, මුදල් අයකැමි, බලකොටුභාර නිපධාරී, නගර අධ්‍යක්ෂක, රාජ්‍ය සීමා ආරක්ෂක.
- පහළ ගණයේ නිලධාරීන් : වන සම්පත්, කිරුම් මිනුම්, සිවර්ණාභර්ණ, කෘෂිකර්ම, ඇත්, අස්, රිය, පාබල වැනි අමාත්‍යාංශ සම්බන්ධ නිලධාරීන්.
- යුක්ත, දූත, ලේඛන, මහාමාත්‍ර, ප්‍රතිවේදක (පටිවේදක) වශයෙන් තවත් නිලධාරීන් කොටසක් සිටීම.

**යුක්ත** (වසර 05 කට වරක් රට පලුරා සංචාරය කර පර්ෂදගේ නියෝග ක්‍රියාත්මක කිරීම), **ලේඛක** (ලිපි ලේඛන භාරවීම), **දූත** (රජයේ නියෝග වෙනත් ප්‍රදේශවලට ලෙනයාම), **මහාමාත්‍ර** (අශෝක රජු අභිෂේකයෙන් 14 වැනි වර්ෂයේ මේ අය පත් කළේය. මෙහි අංශ 02කි. ස්ත්‍රී අධ්‍යක්ෂක හා ධර්ම අධ්‍යක්ෂක වශයෙනි. මොවුන් විනිසුරුවන් හා අනුශාසකයන් ලෙස කටයුතු කිරීම), **ප්‍රතිවේදක** (චරපුරුෂයන්ගේ කටයුතු කිරීම, විවිධ වෙස් ගැනීම).

- කෞටිල්ලගේ අර්ථශාස්ත්‍රයේ දක්වන ආකාරයට ඇත්, අස්, රිය, පාබල, නාවුක, බඩුබාහිරාදිය ගෙන යන වශයෙන් සීටීම.

**ප්‍රාදේශීය පාලනය.**

- මෞර්ය අධිරාජ්‍යයේ විහාලත්වය නිසා කොටස් 05 කට බෙදා පාලනය කිරීම.
- පාටලීපුත්‍රය (ප්‍රාච්‍ය)
  තක්ෂිලා (ගන්ධාරය)
  උජ්ජෙනිය (අවන්තිය)
  ස්වර්ණගිරිය (දක්ෂිණාපතය)
  කෝසල (කාලිංගය)
- ප්‍රධානියා නගරාධිපති වීම, කෞටිල්‍ය විසින් නගරාධිපති ''නගරක'' නමින් හැඳින්වීම. සහායට ස්ථානික, ගෝප නිලධාරීන් සිටීම.
- මෙගස්තිනීස්ට අනුව පාටලීපුත්‍ර නගරයේ පාලනය නිලධාරීන් 05 දෙනෙකු යටතේ වූ මණ්ඩල 6ක් මඟින් ක්‍රියාත්මක විය. කර්මාන්ත, විදේශ කටයුතු, නිෂ්පාදන, ආදායම්, උපත් හා මරණ, වෙළඳ අංශ.
- පහළම පාලන ඒකකය ගම විය. එහි ප්‍රධානියා ග්‍රාමිණී විය.

  පාලනයේ දී රාජ්‍ය ආදායම් මාර්ග පිළිබඳව ද අවධානය යොමු විය. ගණිකා වෘත්තියෙන්, සූදු පිටිවලින් හා, මත්පැන්හල්වලින් ආදායම් ලබා ගැනීම, නාග, බලි, බදු ආදායමෙන් සුබසාධනය, රාජ්‍ය නිලධාරීන්ට වැටුප් ගෙවීම, රජ ගෙදර වඩත්තුව, ධර්ම ප්‍රචාරක කටයුතු සිදු කිරීම.

***(ලකුණු 16 යි)***

**09) (III) තුන්වන ධර්ම සංගායනාව සහ එහි ප්‍රතිඵල**

- ක්‍රි.පූ. 03 වන සියවසේ (බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236 කට පසු) අශෝක අධිරජුගේ අනුග්‍රහයෙන් පැවැත්වීම.
- මොග්ගලීපුත්ත තිස්ස මහරහතන් වහන්සේ ප්‍රධානත්වයෙන් පැළලුප් නුවර අශෝකාරාමයේ රහතන් වහන්සේ 1000 ක සහාභාගීත්වයෙන් මාස නවයක් පුරා පැවැත්වීම.
- මේ පිළිබඳව කිසිදු ඉන්දියානු මූලාශ්‍රයක සඳහන් නොවීම හා මේ ගැන ලාංකේය මූලාශ්‍රවල පමණක් කරුණු සඳහන් වීම. මේ සිදුවීම තහවුරු නෙරෙන පුරා විද්‍යාත්මක සාධක දෙරටින් හමු වීම. (සාංචියේ හා සේනාරියේ ධරතු කරඬු, මිහින්තලේ සහ රජගල ලිපි).
- අශෝක රජු දවස බුදුදහමේ උන්නතියට මෙන්ම භික්ෂූන්ට අවශ්‍ය පහසුකම් ලැබෙන බව දුටු අන්‍යාගම්කයන් පා භසත්කාර අපේක්ෂාවෙන් ශාසනයට ඇතුල්වීමෙන් ශාසනික පරිහානියක් ඇති වීම.
- මේ තත්ත්වයෙන් ශාසනය මුදවා ගැනීමට තුන්වන ධර්ම සංගායනාව පැවැත්වීම සහ සංඝ ශෝධනයක් කර දුසිවත් භික්ෂූන් හැට දහසක් ශාසනයෙන් නෙරපා දැමීම.

<u>තුන්වන ධර්ම සංඝායනාවේ ප්‍රතිඵල :</u>

- මොග්ගලිපුත්ත තිස්ස මහරහතන් වහන්සේ අන්‍ය නිකායික මත 500 ක් ඛණ්ඩනය නරමින් ථෙරවාදී මත තහවුරු කරමින් *කථාවත්ථුප්පකරණය* නම් අභිධර්ම ග්‍රන්ථය රචනා කිරීම. එයින් ත්‍රිපිටකය සම්පූර්ණ වීම.
- බුදුදහම ප්‍රචාරය සඳහා අනුග්‍රාහයෙන් රටවල් 09 කට ධර්මදූතයන් වහන්සේ පිටක් කර හැරීම.
- පොහොය කර්මාදිය සිදු කිරීමට නැවත අවස්ථාව සැලසීම.

***(ලකුණු 08 යි)***

**II කොටසේ පළමු ප්‍රශ්නයට අදාළ ඉන්දීය සිතියම**

